(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 106.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2024 ජනවාරි 24 බදාදා පූ.භා.9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

426/2023

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය නගා සිටුවීම සඳහා ස්ථාපිත කර ඇති රාජ්‍ය ආයතනවල නම් කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ වාර්ෂික පොල් නිෂ්පාදනයෙන් ගෘහස්ථ පරිභෝජනය, පොල් තෙල් නිෂ්පාදනය හා අපනයනය ආශ්‍රිත කර්මාන්ත යන එක් එක් අංශය සඳහා භාවිතා කරනු ලබන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2001 සිට 2020 දක්වා එක් එක් වර්ෂයේ ශ්‍රී ලංකාවේ පොල් ඵලදාව එක් එක් වර්ෂයට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පොල් ඵලදාව ඉහළ නැංවීම සඳහා ඉහත කාලය තුළදී සිදු කරන ලද වැඩසටහන් කවරේද;

(v) එම වැඩසටහන් සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

436/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කිලෝග්‍රෑම් 1ක් බරැති සම්පූර්ණ යොදය සහිත හා යොදය රහිත කිරිපිටි පැකට්ටුවක් සහ ග්‍රෑම් 400ක් බරැති සම්පූර්ණ යොදය සහිත හා යොදය රහිත කිරිපිටි පැකට්ටුවක්—

(i) අලෙවි කරනු ලබන මිල;

(ii) භාවිතා කර සකස් කළ හැකි කිරි ලීටර් ප්‍රමාණය;

(iii) සෑදීමට භාවිතා කරනු ලබන දියර කිරි ලීටර් ප්‍රමාණය;

එක් එක් සමාගම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවේ අලෙවි කරනු ලබන දියර කිරි පැකට්වල පරිමාව සහ එම පරිමාව අනුව එක් එක් දියර කිරි පැකැට්ටුවක මිල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

694/2023

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මඩකලපුව, මඩ/පට්/කුරුක්කල්මඩම් කලෛයිවාණි මහා විද්‍යාලය මේ වනවිට මහ වීදියේ ස්ථාපිතකර ඇති අතර එම විද්‍යාලය පෙර තිබූ ස්ථානයේ පැවති ක්‍රීඩාපිටියෙන් කොටසක් මේ වනවිට ශ්‍රී ලංකා යුද හමුදාව භාරයේ පවතින බවත්;

(ii) ඒ හේතුවෙන් ක්‍රීඩා කිරීම සඳහා එම ක්‍රීඩාපිටිය භාවිතා කිරීමට නොහැකි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත ක්‍රීඩාපිටිය ශ්‍රී ලංකා යුද හමුදාවෙන් නිදහස් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නැගෙනහිර පළාතේ තවත් ක්‍රීඩාපිටි යුද හමුදාව භාරයේ පවතින්නේද;

(ii) එසේ නම්, එම ක්‍රීඩාපිටි සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iv) එම ක්‍රීඩාපිටිද ශ්‍රී ලංකා යුද හමුදාවෙන් නිදහස් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

826/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වර්ෂයකට නිෂ්පාදනය කරනු ලබන එළවළු ප්‍රමාණය මෙට්‍රික් ටොන්වලින් කොපමණද;

(ii) වාර්ෂිකව පරිභෝජනය කරනු ලබන එළවළු ප්‍රමාණය කොපමණද;

(iii) එළවළු නිෂ්පාදනයේ අතිරික්තයක් හෝ ඌනතාවයක් තිබේ නම්, එම ප්‍රමාණය කොපමණද;

(iv) වර්ෂ 2015 සිට 2019 දක්වා වූ කාල පරිච්ඡේදයේදී සහ වර්ෂ 2019 සිට 2021 දක්වා වූ කාල පරිච්ඡේදයේදී ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද එළවළු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

839/2023

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බස්නාහිර පළාතේ අධ්‍යාපන කලාප අතරින් ගුරු අතිරික්තයක් හා ගුරු හිඟයක් පවතින අධ්‍යාපන කලාප කවරේද;

(ii) එම අතිරික්ත ගුරුවරුන් සංඛ්‍යාව සහ හිඟ ගුරුවරුන් සංඛ්‍යාව එක් එක් විෂය අනුව කොපමණද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

853/2023

ගරු ගාමිණී වලේබොඩ මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් සභා වෙත පොලිස් බලතල පැවරිය යුතු බවට වර්තමාන රජයේ ප්‍රධානීන් ප්‍රකාශ කර ඇති බව දන්නේද;

(ii) මේ වනවිට මධ්‍යම ආණ්ඩුව සතුව පවතින පොලිස් බලතල, පළාත් සභා වෙත පැවරීම සඳහා සැලසුම් කර තිබේද;

(iii) ඒ හේතුවෙන් මේ වනවිට ශ්‍රී ලංකා පොලීසිය සහ ඊට අදාළ අනෙකුත් ආයතන සඳහා වැය කරනු ලබන වියදම් සංශෝධනය වන්නේද;

(iv) එසේ නම්, එම සංශෝධනය වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළාත් සභා වෙත පොලිස් බලතල ලබා දීමෙන් මේ වනවිට පවතින ශ්‍රී ලංකා පොලිසියේ බඳවාගැනීමේ පටිපාටියේ සිදු වන වෙනස්කම් කවරේද;

(ii) පළාත් සභා වෙත පොලිස් බලතල ලබා දීමෙන් අවි ආයුධ මිලදී ගැනීමේ බලතල සෘජුවම පළාත් පොලිසි වෙත හිමිවේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

874/2023

ගරු රෝහණ බංඩාර මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර ඇති මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1718/2023

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා මෙරටට ලැබුණු විදේශ ප්‍රේෂණවල වටිනාකම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වටිනාකම, සමස්ථ විදේශ විනිමය ඉපයීම්වල ප්‍රතිශතයක් ලෙස ඉහත සඳහන් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නීත්‍යානුකූල ක්‍රමවේද ඔස්සේ ශ්‍රී ලංකාවට විදේශ මුදල් ප්‍රේෂණය කිරීම දිරිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2020/2023

ගරු කිංස් නෙල්සන් මහතා,— වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ මහපොළ අභ්‍යාස ආයතනය (මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය) ක්‍රියාත්මක වන බව දන්නේද;

(ii) එම ආයතනය විසින් මේ වනවිට පවත්වනු ලබන පාඨමාලා සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් පාඨමාලාව කවරේද;

(iv) එම ආයතනය ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික සංවර්ධනයට යොදා ගනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

3799/2023

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර මත ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් කඩුගන්නාව සිට ගම්පොල දක්වා විදුලි දුම්රිය මාර්ගයක් ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

(ii) එම දුම්රිය මාර්ගය ඉදිකිරීමේදී ගම්පොල, උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කහටපිටිය සහ බෝතලපිටිය යන ගම්මානවල පදිංචිකරුවන් විසින් භාවිතා කරනු ලබන දේවරාජ මාර්ගය ඇතුළු අනෙකුත් ප්‍රවේශ මාර්ග අහිමිවීමේ අවදානමක් පවතින බව දන්නේද;

(iii) එම පදිංචිකරුවන්ගේ නිවාස, මහවැලි ගඟ ආශ්‍රිතව පර්චස් 4,6 වැනි කුඩා ඉඩම් කොටස්වල ඉදිකර ඇති බැවින් ඔවුන්ගේ නිවාස/දේපලවලට සහ ප්‍රවේශ මාර්ගවලට හානි නොවන අයුරින් ඉහත මාර්ගය ඉදිකිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ඉදිරිපත් කරනු ලබන යෝජනා කවරේද;

(v) ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන විකල්ප යෝජනා සලකා බලන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී
### පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— බෙදුම් නඩු (සංශෝධන),— ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

### යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා සහ අ.භා. 1.00 සිට අ.භා. 6.00 දක්වා ද විය යුතු ය. අ.භා. 5.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 5 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

4.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— වරප්‍රසාද,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2023 නොවැම්බර් 07 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2024 පෙබරවාරි 06 අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2024 ජනවාරි 23) [1]

*2.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 24 වගන්තිය යටතේ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ජුනි 01 දිනැති අංක 2334/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.12.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 නොවැම්බර් 01 දිනැති අංක 2356/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.01.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියමය,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 දෙසැම්බර් 20 දිනැති අංක 2363/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.01.11 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

5.

පා. 83/2024

ගරු බුද්ධික පතිරණ මහතා
ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
ගරු අලි සබ්රි රහීම් මහතා
ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා
ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු ලසන්ත අලගියවන්න මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ඇතුළු ජල මූලාශ්‍ර මඟින් පැන නැඟී ඇති ගැටලු පිළිබඳව ගැඹුරින් විමර්ශනය කර නව ප්‍රතිනිර්මාණ යෝජනාවලියක් සැකසීම සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— මාතර දිස්ත්‍රික්කයේ ගොන්ගල හා රක්වාන කඳු පන්තිය ආශ්‍රිතව පැන නගින නිල්වලා ගඟ හා ගිං ගඟ පිළිවෙළින් මාතර හා ගාල්ල දිස්ත්‍රික්ක හරහා ගලා ගොස් මුහුදට එකතු වන අතර පොල්වත්ත ගඟ ද එවැනිම වැදගත් ජල මූලාශ්‍රයක් වන හෙයින්ද;

ලන්දේසි පාලන යුගයේ මෙම ගංගාවන්හි ජල කළමනාකරණය හා ගංවතුර කළමනාකරණය කෙරෙහි මුලින්ම අවධානය යොමු වී ඇති අතර නිදහස් ශ්‍රී ලංකාවේ ගිං හා නිල්වලා ගංගාවන්හි ජලය ගිනිකොනදිග ලංකාව හෙවත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ පෝෂණය සඳහා යොදා ගැනීම පිළිබඳව මුල් යෝජනාව එවකට අකුරැස්ස පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වූ දොස්තර එස්. ඒ. වික්‍රමසිංහ මහතා විසින් 1950 දශකයේදී ඉදිරිපත් කර ඇති හෙයින් ද;

ගිං හා නිල්වලා ගංගා ආශ්‍රිත ජලය කළමනාකරණය කරමින් වාර්ෂිකව ඇතිවන ගංවතුර කළමනාකරණය කර එම ජලය දිස්ත්‍රික්ක දෙකෙහි ජනතාවගේ මානව ක්‍රියාකාරකම්, කෘෂිකාර්මික හා කර්මාන්ත ක්‍රියාවලිය, ජෛව විවිධත්වය හා පරිසර තුලනතාවය පවත්වා ගෙන යාම උදෙසා විධිමත්ව යොදා ගැනීම පිළිබඳව ඉන්පසු විවිධ විශේෂඥයින් විසින් වාර්තා ඉදිරිපත් කර ඇති හෙයින් ද;

1977 න් පසු නිල්වලා ගඟ ගංවතුර වැළැක්වීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වුවද එය 1987–1989 වකවානුවේ රටේ පැවැති වාතාවරණය හේතුවෙන් අතරමග නතර කෙරුණු අතර, ඒ හේතුවෙන් නිල්වලා ගඟ ආශ්‍රිතව ගොවිබිම්, පුරන්බිම් බවට පත්වූ අතර, ගංවතුර තර්ජනය නොවෙනස්ව ක්‍රියාත්මක වෙමින් පවතින බැවින් නියං සමයේ කරදිය නිල්වලා ගඟ ඔස්සේ ඉහළට ගමන් කරමින් පානීය ජලයට මෙන්ම ගොවිබිම්වලට ද කරදිය මුසුවීම හේතුවෙන් බරපතල ගැටලු ඇති වූ අතර, ඒ වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද නිල්වලා ලවණ බාධකය හේතුවෙන් මේ වනවිට ගංවතුර අඛණ්ඩව ගොවිබිම් තුළ රැඳීම තුළින් වී, කුරුඳු, එළවළු, පොල් හා වෙනත් බෝග වගාවන්ට මෙන්ම කිරි ගොවීන් ද දුෂ්කරතා රැසකට මුහුණපාන ඛේදනීය තත්ත්වයක් නිර්මාණය වී ඇති හෙයින් ද;

ගිං ගඟ ආශ්‍රිතව ලවණ බාධකය සාර්ථක වූ අතර, නිල්වලා ගඟ ආශ්‍රිත ලවණ බාධකය අසාර්ථක වීම පිළිබඳව ගැඹුරින් විශ්ලේෂණය කළ යුතු තත්ත්වයක් වර්ධනය වී ඇති හෙයින් ද;

(අ) නිදහස් ශ්‍රී ලංකාවේ දශක 7½ කට ආසන්න යුගය තුළ ගිං සහ නිල්වලා ගංගා පිළිබඳව විද්වත් හා විශේෂඥයින් කරන ලද අධ්‍යයනයන් පිළිබඳව ගැඹුරින් විශ්ලේෂණය කර එකී යෝජනාවන්හි ඇති සාධනීය ලක්ෂණ හඳුනාගැනීමට ද;

(ආ) නිල්වලා හා ගිං ගංගාවන් හි ඉහළ ද්‍රෝණියේ අතිරික්ත ජලය ගිණිකොන දිග ලංකාවට ගෙනයාම පිළිබඳව විද්‍යාත්මක පදනමකින් මෙන්ම ජන ජීවිතයට අවම පීඩනයක් ඇති වන ආකාරයෙන් කටයුතු කිරීමේ ක්‍රමවේද සම්බන්ධයෙන් ප්‍රායෝගික වැඩපිළිවෙළක් නිර්මාණය කිරීම පිළිබඳව යෝජනා ලබා ගැනීමට ද;

(ඇ) ඉහත (ආ) හි සංවර්ධන යෝජනාව මෙයට පෙර ක්‍රියාත්මක කිරීමට අදාළව ගන්නා ලද ක්‍රියාමාර්ග/වියදම් කරන ලද දේශීය හා විදේශීය අරමුදල්වල ඵලදායිතාව පිළිබඳව ගැඹුරින් විමර්ශන සිදු කිරීමට ද;

(ඈ) නිල්වලා ලවණ බාධකය හේතුවෙන් පැන නැගී ඇති සියලුම ආකාරයේ පීඩාවන් ඉවත් කිරීමට ගතයුතු කඩිනම් කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන යෝජනා සකස් කර ක්‍රියාත්මක කිරීමට අදාළ නිර්දේශ ලබා දීමට ද;

(ඉ) දිස්ත්‍රික්කයේ ජල පාරිභෝගිකයන් මෙන්ම අනාගතයේ පුළුල් කළ හැකි ජල ව්‍යාපෘති සඳහා දිගිලිඔය ඇතුළු ප්‍රදේශ තුළ උචිත නව ජල පවිත්‍රකරණ මධ්‍යස්ථාන ගොඩනගා ගැනීම හඳුනාගැනීමට ද, දැනට ක්‍රියාත්මක ජල පොම්පාගාර පිළිබඳ විද්‍යානුකූල පදනමින් විශ්ලේෂණය කරමින් නව ක්‍රමෝපායන් යෝජනා කිරීමට ද;

(ඊ) නිල්වලා ගඟ ආශ්‍රිතව සිදුවන කිඹුල්-මිනිස් ගැටුම පිළිබඳව තිරසර විසඳුමක් සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරීමට ද;

(උ) දකුණු පළාතේ කාර්මික, කෘෂිකාර්මික, ජල විදුලි උත්පාදනය, පශු සම්පත් ක්ෂේත්‍රය වෙනත් මානව ක්‍රියාකාරකම් මෙන්ම ජෛව විවිධත්වය ආරක්ෂා කර ගනිමින් නිල්වලා හා ගිං ගංගාවල ජලය මුහුදට ගලා යාමට ප්‍රථම උපරිම ක්ෂමතාවයකින් භාවිතා කිරීම සම්බන්ධයෙන් වූ අදාළ යෝජනා ලබා ගැනීමට ද;

(ඌ) හුදෙක් ගංවතුර වැළැක්වීමේ සංවර්ධන ව්‍යාපෘතියකින් ඔබ්බට ගොස් ගිං-නිල්වලා කඩිනම් බහු කාර්ය යෝජනා ක්‍රමයක් මඟින් ඇති වී ඇති ගැටලු සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට මෙන්ම, මෙකී ජල මූලාශ්‍රයන් ප්‍රවාහනය, මිරිදිය ධීවර කර්මාන්තය, සංචාරක ව්‍යාපාරය, සංස්කෘතික ප්‍රබෝධය උදෙසා භාවිතා කිරීමට අදාළ නව නිර්මාණශීලී ප්‍රවේශයන් හඳුනාගැනීමට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීමට ද;

(එ) ගිං, නිල්වලා සහ පොල්වත්ත යන ගංගා ආශ්‍රිතව එකී ගංගාවලට එකතුවන අතු ගංගා/ආර හා එවැනි ආකාරයේ ජල පෝෂකයන් ආශ්‍රිතව මෙන්ම මෙකී ගංගා ද්‍රෝණි නිම්නයන් තුළ සිදු කළ යුතු සංවර්ධන ක්‍රියාවලීන් හඳුනාගැනීම, එකී ගංගා දෙපස රක්ෂිත ඇති කිරීම, අපද්‍රව්‍ය එක් කිරීම වළක්වා ගැනීම, මානව ක්‍රියාකාරකම් තුළින් ගංගා ජලය දූෂණය කරන්නා වූ ක්‍රමවේද පිටු දැකීම, අනවසර ඉදිකිරීම් මඟින් ජල මූලාශ්‍ර අවහිර කිරීම මෙන්ම ඇතැම් ජල විදුලි බලාගාර හරහා ගංගාවන්ට හා ජෛව විවිධත්වයට සිදු කරන හානි හඳුනාගෙන එකී තත්ත්වයන් පිටු දැකීමට අදාළ යෝජනා ඉදිරිපත් කිරීමට ද;

(ඒ) අතරමඟ නතර කරන ලද ඉහත ගංගාවලට අදාළ සංවර්ධන ව්‍යාපෘති තුළ ඉටු කළ යුතු අසම්පූර්ණ වැඩ කොටස් හඳුනා ගෙන එකී වැඩ කොටස් ක්‍රියාත්මක කිරීමට අදාළ යෝජනා සැකසීම, අවශ්‍ය අවස්ථාවන්හිදී මෙකී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සිදු කරන ලද වියදම් පිළිබඳ ව්‍යවහාරික විගණනයන් ඇතුළු සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කිරීමට ද; සහ

(ඔ) ඉහත (එ) හි සඳහන් ගංගාවන්ට අදාළ වෙනත් කවර හෝ ඉටු කළ යුතු සංවර්ධන ක්‍රියාදාමයන් අතරමඟ නතර වූ ක්‍රියාදාමයන්, අසාර්ථක වූ ක්‍රියාදාමයන් පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කර කෙටි කාලීනව, මධ්‍ය කාලීනව හා දිගු කාලීනව ක්‍රියාත්මක කිරීමට සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාවෙහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් පත්කළ යුතුය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101හි විධිවිධානයන්හි කුමක් සඳහන්ව තිබුණද කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් විසි දෙනෙකුගෙන් (20)සමන්විත විය යුතුය.

3. එම කාරක සභාවට —

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු පූර්ණ වශයෙන් සලකා බැලීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඇ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද

බලය තිබිය යුතු ය.

4. සිය පළමු රැස්වීම් දිනයේ සිට මාස තුනක (03) කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් ලබාදෙන එවැනි අමතර කාලසීමාවක් තුළ හෝ කාරක සභාව විසින් සිය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

*6.
සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.
කාලාවරෝධ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.
භාර ලදුපත් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.
උකස් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.
කල්බදු මූල්‍යකරණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.
දේශීය භාර ලදුපත් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.
සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.
ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

සත්ව සුබසාධන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග,— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 52(5) වගන්තිය සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ඔක්තෝබර් 25 දිනැති අංක 2355/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.12.02 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පුරාවස්තු ආඥාපනත යටතේ නියෝග,— (188 වන අධිකාරය වූ) 1940 අංක 9 දරන පුරාවස්තු ආඥාපනතේ 46 වගන්තිය සමඟ කියවිය යුතු 47(1) වගන්තිය යටතේ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් 2023 මැයි 25 දින සාදනු ලදුව, 2023.07.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග (අංක 1),— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 61 වගන්තිය සමඟ කියවිය යුතු 60 වගන්තිය යටතේ අග්‍ර විනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව, අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 ජූලි 30 දිනැති අංක 2238/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2024.01.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග (අංක 2),— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 61 වගන්තිය සමඟ කියවිය යුතු 60 වගන්තිය යටතේ අග්‍ර විනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ඔක්තෝබර් 26 දිනැති අංක 2303/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2024.01.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග (අංක 3),— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 60 වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ අග්‍ර විනිශ්චයකාරවරයා විමසා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 දෙසැම්බර් 14 දිනැති අංක 2362/67 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.01.12 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*24.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— නීති අධ්‍යාපන සභා ආඥාපනත යටතේ රීති,— (276 අධිකාරය වූ) නීති අධ්‍යාපන සභා ආඥාපනතේ 7 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සංස්ථාගත නීති අධ්‍යාපන සභාව විසින් සාදන ලදුව, 2023 මැයි 15 දිනැති අංක 2332/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.07.18 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*25.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මාර්තු 24 දිනැති අංක 2324/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.25 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 සැප්තැම්බර් 09 දිනැති අංක 2296/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.10.06 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

ධීවර අමාත්‍යතුමා,— සීමාසහිත සීනෝර් පදනමේ වාර්ෂික වාර්තාව (2018),— 2007 අංක 07 දරන සමාගම් පනතේ 131 වගන්තිය යටතේ 2023.01.17 දින ඉදිරිපත් කරන ලද 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සීමාසහිත සීනෝර් පදනමේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.22 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.03.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*28.

ධීවර අමාත්‍යතුමා,— ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2019),— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තිය යටතේ 2022.11.30 දින ඉදිරිපත් කරන ලද 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.22 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.03.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*29.

ධීවර අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව (2020),— 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනත යටතේ 2023.03.24 දින ඉදිරිපත් කරන ලද 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.07.06 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.08.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

30.

ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

31.

දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

32\.
රොෂාන් රණසිංහ ජනසහන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

33\.
සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

34\.
සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

35\.
හදිසි මහජන සෞඛ්‍ය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

36\.
ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

37\.
විවාහ (සාමාන්‍ය) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

38\.
මුස්ලිම් විවාහ හා දික්කසාද (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

39\.
ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

40\.
විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

41\.
විවාහවීමේ අවම වයස පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

42\.
වෘත්තීයවේදීන්ගේ ප්‍රජා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

43\.
සත්‍ය ශ්‍රී ගණපති භක්ති ජන සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

44\.
අරුන්දික ප්‍රනාන්දු සහන සේවා සහ ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු අනුස්මරණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

45.

ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**[1]**

''පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය'' යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---